**ශීර්ෂය 327 - ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 දෙසැම්බර් 10 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කල එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිළධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිළධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක හා සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතාකරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරවු කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුලත් වී ඇති බව සහ හෙළිදරවු කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 **(1)** (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළව මා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාර ඉදිරිපත් කර තිබුණු වාර්තාවේ **1.6.2** (ආ) ඡේදයේ දක්වා තිබුණු නිරීක්ෂණයේ සඳහන් පරිදි අදාල වත්කම්වල වටිනාකම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේදී ද ගිණුම්ගත කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) නිසි ලෙස කරුණු සොයා බලා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා නොගැනීම සහ නියමිත කාල වකවානුව තුළදී නිශ්චිත කාර්යසාධන ඉලක්ක සපුරා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන් 10 කට අදාළව එකතුව රු.6,435,280 ක ඉතිරිවීම් සහ ප්‍රාග්ධන වැය විෂයයන් 08 කට අදාළව එකතුව රු.12,899,464 ක ඉතිරිවීම් පැවතුණි. | මු.රෙ. 50 ප්‍රකාරව නිවැරදිව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | දෙපාර්තමේන්තුවේ සමස්ත පුනරාවර්තන වියදම් ප්‍රතිපාදන වලින් 97% ක් වියදම් දැරීම සිදුකර ඇත. එමෙන්ම සමස්ත ප්‍රාග්ධන වියදම් ප්‍රතිපාදන වලින් 91% ක් වියදම් දරා ඇත. |
| (ආ) වැය විෂයය අංක 327-02-01-1406 - කල් බදු වාහන සඳහා පොලී ගෙවීම සහ වැය විෂයය අංක 327-02-01-2108 - මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ වාහන ණය ආපසු ගෙවීම යන වැය විෂයයන් දෙක සඳහාම වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි. පසුව පිළිවෙලින් රු.1,795,000 ක හා රු.2,726,000 ක පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන ලබාගෙන තිබුණු අතර, එම පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනවලින් ද පිළිවෙලින් සියයට 16 ක් හා සියයට 15 ක් වර්ෂය අවසානයට ඉතිරිකර තිබුණි. | පරිපූරක ඇස්තමේන්තු මඟින් ලබාගත් ප්‍රතිපාදන එම කාර්යයන් සඳහා යෙදවිය යුතුය. | මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ වාහන 03 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු 2019 ජුනි මස මුල් සතිය වන විට අවසන් කර, තෝරාගත් මූල්‍ය ආයතනය වෙත ලබාදුන් අතර ඔවුන් විසින් ලබාදී තිබූ වාරික අයකිරීම් විස්තරයට අනුව 2019 ජූලි මස සිට දෙසැම්බර් දක්වා අදාළ පරිපූරක ප්‍රතිපාදන වෙන් කර ගන්නා ලදී. එහෙත් එම මූල්‍ය ආයතනය ගිවිසුම් වලට එළඹීම අගෝස්තු මස සිදුවූ අතර ඉන්පසු වාරික අය කිරීම ආරම්භ කර ඇත. ඒ අනුව 2019 වර්ෂය සඳහා වාරික 05ක් පමණක් අයකර ගෙන ඇත. |

| | | |
|---|---|---|
| (ඇ) අංක 327-02-01-1404 සහ අංක 327-02-01-2102 දරන යන වැය විෂයයන් දෙකට අදාළව එකතුව රු.1,076,000 ක ප්‍රතිපාදන මු.රෙ. 66 යටතේ වෙනත් වැය විෂයයන්වලින් මාරුකරගෙන තිබුණු අතර, මෙසේ මාරුකරගත් ප්‍රතිපාදනවලින් එකතුව රු.220,945 ක් හෙවත් සියයට 21 ක් පමණ ඉතිරිකර තිබුණි. | වෙනත් වැය විෂයන් සඳහා ප්‍රතිපාදන මාරු කර ගත්තේ නම් මාරු කර ගත් අරමුණට ප්‍රතිපාදන යෙදවිය යුතුය. | පළාත් පාලන ආයතන වලින් බිල්පත් ඉදිරිපත් නොවීම හා ගෘහ භාණ්ඩ ඇණවුම් කලද සැපයුම්කරුවන් විසින් ලබාදීමට අපොහොසත් වීම මත මෙම ඉතිරිවීම් සිදුවී තිබුණි. |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිලිබඳ සැසඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වැඩ තහනම් කළ 26,998 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි අය නොවූ ණය ශේෂ සම්බන්ධයෙන් කටයුතු කළයුතු වීම. | **මෙම ණය ශේෂ අයකර ගත නොහැකි ණයක් සේ සලකා කපා හැරීම සඳහා භාණ්ඩාගාරයෙන් ඉල්ලීමක් කර ඇත.** |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකාවේ භූමි සම්පත් ප්‍රශස්ත හා තිරසාර ලෙස පරිහරණය කිරීම දෙපාර්මේන්තුවේ දැක්ම වන අතර, පාරිසරික සමතුලිතතාවය පවත්වා ගනිමින් තිරසාර හා ප්‍රශස්ත ලෙස භූමි පරිහරණය කිරීමට ප්‍රතිපත්ති සම්පාදනය සහ සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමට සහාය වීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන මෙහෙවර වේ. එම දැක්ම සහ මෙහෙවර ඉටුකර ගැනීමට ජාතික ඉඩම් පරිහරණ පනත සම්මත කර ගැනීමට දෙපාර්තමේන්තුව මේ වන තෙක් අපොහොසත් වී ඇත. | කඩිනමින් ඉඩම් පරිහරණ පනත සම්මත කර ගතයුතු වීම. | මෙම දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර ඉටු කර ගනිමින් ජාතික ඉඩම් පරිහරණ පනත සම්මත කර ගැනීම සඳහා දෙපාර්තමේන්තු මට්ටමින් ගත හැකි පියවරයන් මේ වන විට ගනිමින් පවතී. |

## 3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2020 ජුනි 30 දින වන විටත්, කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. | කාර්යසාධන වාර්තාව රේඛීය අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. |

## 3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව සතු කාර් රථයක් ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත වර්ෂ දෙකකට අධික කාලයක සිට මුදා හැර තිබුණු අතර, එය මෙතෙක් පවරා දීමට හෝ ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා ලබා දී ඇති වත්කම් වෙනත් ආයතනවලට පැවරීමේදී දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකිරීමට බාධාවක් නොවන ලෙස එම වත්කම් විධිමත්ව පවරා දීමට කටයුතු කළ යුතුය. | අමාත්‍යාංශය වෙත පවරාදීම සඳහා අදාළ ලියවිලි භාර දී ඇත. |
| (ආ) | අලුත්වැඩියා කළ නොහැකි තත්ත්වයේ පවතින වාහන දෙකක් වසර 04 ක කාලයක් තිස්සේ නිෂ්කාර්යව පවතී. | නිෂ්ක්‍රීය වත්කම් අපහරණය කළයුතු වීම. | අලුත්වැඩියා කිරීම ආර්ථික වශයෙන් වාසි නොවන බැවින් අපහරණය සඳහා කටයුතු සිදු කෙරෙමින් පවතී. |

**3.4 පාඩු හා හානි**

--------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවට අයත් අංක WP - PF- 7633 දරන මෝටර් රථය 2019 මැයි 22 දින අනතුරට පත්ව රු.48,816 ක අලාභයක් සිදුව තිබුණි. මෙම අලාභය මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය මඟින් හෙළිදරව් කර නොතිබුණි. | අදාළ අලාභය පාඩු සහ අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය මගින් අනාවරණය කළ යුතුය. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම අලාභය පිළිබඳව සටහන් තැබීම මඟහැරී තිබුණි. |

**3.5 කළමනාකරණ දුර්වලතා**

--------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (2) වගන්තිය ප්‍රකාරව ගිණුම් සමඟ ඉදිරිපත් කළ යුතු අස්ථිත්වයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | විගණන පනතේ අදාළ වගන්තිය ප්‍රකාරව කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කළ යුතුය. | එකඟ වේ. වාර්ෂික ගිණුම් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අත්සන සඳහා ඉඩම් අමාත්‍යංශයට ඉදිරිපත් කරන අවස්ථාවේදීම වාර්ෂික කාර්ය සාධන වාර්තාවද ඉදිරිපත් කරන ලදී. |

**4. මානව සම්පත් කළමනාකරණය**

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2002 වර්ෂයේදී ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරියකු ඉඩම් අමාත්‍යාංශය වෙත අවිධිමත් ලෙස මුදාහැර තිබුණි. | තනතුරු නාමය අනුව දෙපාර්තමේන්තුවට අවශ්‍ය නිලධාරියකු නිසා, ඒ අනුව ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. | රේඛීය අමාත්‍යාංශයේ කටයුතු සඳහා ඉඩම් පරිහරණ විෂය දැණුම සහිත නිළධාරියකු අමාත්‍යාංශය සඳහා මුදාහැර ඇත. |
| **(ආ)** ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 10 ක්, තෘතියික මට්ටමේ පුරප්පාඩුවක් හා ද්විතියික මට්ටමේ පුරප්පාඩු 40 ක් පිරවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | අත්‍යාවශ්‍ය සේවක පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. | සේවක පුරප්පාඩු පිරවීම ඒ සඳහා වූ විධිමත් පත්වීම් බලධාරීන් සිදුකරනු ලබන අතර එම බලධාරීන් වෙත පුරප්පාඩු දන්වා ඇත. |